**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධව විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුලත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය ගැතියන්ගේ පැවැත්ම හා ආයු කාලය පිළිබඳව සැළකිල්ලට ගැනීමකින් තොරව අඩමාණ ණය සඳහා සියයට 5 ක පොදු රේටයක් මගින් රු.4,875,963 ක අඩමාණ ණය වෙන්කිරීමක් සිදුකර තිබුණි. | අඩමාණ ණය සඳහා 5% ක පොදු රේටයක් 2018 වර්ෂයේ සිට භාවිතා කරනු ඇත. | ණය ගැතියන්ගෙන් අයවීම් පිළිබඳව සැලකිල්ල යොමුකරමින් අඩමාණ ණය සඳහා වෙන්කිරීමේ රේටයක් නියමකල යුතු වීම. |

### 1.5.3 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314 ක මුදල, බාහිර ආයෝජනවල යෙදවීම තුලින් උපයා තිබූ පොලී ආදායම වූ රු.13,619,369ක් සමඟ සමස්ථ ආයෝජනය රු.13,872,683 ක් විය. මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්ථමානයේදී සේවා සැපයීම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය වගකීම් සහ ආයෝජන යටතේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | මෙම ආයතන බොහොමයක වර්තමාන ලිපිනයන් නොමැති අතර ඇතැම් ආයතන මෙහෙයුම් කටයුතු සිදු නොකරන බව නිරීක්ෂණය වී ඇත. එබැවින්, එම ආයතන නමින් ඇති තැන්පත් ශේෂ රජයේ ආදායමට බැරකිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් විමසා ඇත. එම පිළිතුර මත ඉදිරි පියවර ගැනීමට සටහන් කරගෙන ඇත. | වර්තමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනයකර නිසි ගිණුම් තැබීමක් සිදුකිරීම හෝ අවශ්‍ය වෙනත් ක්‍රියාමාර්ගයන් ගත යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී , සමාලෝචිත වර්ෂය සඳහා රු.850,149,598 ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි. | මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව මගින් සිදු කරන ලද විමසීම් වලට අනුව අවශ්‍ය යෝජනා හා ක්‍රියාපටිපාටි සකස් කිරීම සඳහා අනුකමිටුවක් පත්කරන ලද අතර එකී අනුකමිටු වාර්තාව දැනටමත් ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරීන්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළයුතු බව. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් මුදල් රෙගුලාසි සංග්‍රහයට ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(2) (ඇ) ඡේදය | අතිකාල අරමුදල තුල භාණ්ඩාගාර අරමුදල ලෙස රු.2,133,975,331 ක මුදලක් දීර්ඝ කාලයක සිට සමුච්චිත වෙමින් පැවතියද, විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාකර එම අතිරික්ත මුදල් සමාලෝචිත වර්ෂයේදී ද ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | ගිණුමේ නාමික වශයෙන් පවතින රු.2,133,975,331 ක සමුච්චිත මුදල අතිරික්ත මුදලක් ලෙස දක්වා තිබුන ද මෙම ශේෂය භෞතිකව දෙපාර්තමේන්තු ගිණුමෙහි නොපවතින අතර පවත්නා ක්‍රමවේදයට අනුව දැනටමත් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම වෙත ප්‍රේශණය කර ඇත. | අදාල චක්‍රලේඛය අනුව සමුච්චිත වෙමින් පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර ඒකාබද්ධ අරමුදලට බැරකලයුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 141,774,897 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 55,141,127 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 86,633,770 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුලදී රේගු අතිකාල ආදායම පහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

--------------------------------------------------------------------

රේගු ආඥාපනතේ 103 වගන්තිය අනුව නිකුත් කරන ලද 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී වේලාවන් වලින් පරිබාහිර වේලාවන්වලදී කරනු ලබන රාජකාරී වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරී ස්ථානවලින් පරිබාහිර ස්ථාන වලදී ඉටුකරනු ලබන රාජකාරී සඳහා ඊට අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු හා අයකිරීම්ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තාක්ෂණික සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් අයකරනු ලබන ගාස්තුද අරමුදලට බැර කළ යුතු වේ. එසේම, එම අතිරේක රාජකාරී වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් මෙම අරමුදලේ වැය බරක් සේ සලකනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් පරිදි අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු හා විවිධ ලැබීම් වෙනුවෙන් පිළිවෙලින් රු.788,633,867ක්, රු.304,718,986 ක් හා රු.14,976,000 ක් රැස්කර තිබුණි. එම කාර්යයන්වල නිරත වූ නිලධාරීන්ට පිළිවෙලින් අතිකාල ආදායමෙන් සියයට 107.8 ක් ලෙස රු.850,149,597ක් ද, නැව් බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.152,359,493 ක් ද හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක් ද ගෙවා තිබුණි.ඉහත ගෙවීම් ක්‍රියාවලිය තුල විගණනයේදී අනාවරණය වූ කරුණු පහත පරිදිවේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අතිකාල අරමුදලේ ලැබීම් සහ ගෙවීම් අංක 1520/17 දරණ 2007 ඔක්තෝබර් 07 දිනැති ගැසට් පත්‍රයට අනුව සහ දෙපාර්තමේන්තු නියෝග DOPL 218F ට අනුකූලව සිදු කරන අතර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ පත්කර ඇති අතිකාල කමිටුව මගින් කාලීනව අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් සමාලෝචනය කරනු ඇත. | වර්තමාන අතිකාල ගෙවීම් ක්‍රියාවලිය සමාලෝචනය කර විධිමත් කිරීම. |
| (ආ) වර්ෂය තුලදී රැස්කල අතිකාල ආදායම ඉක්මවා රු.61,515,730ක් අතිකාල වියදම් ලෙස නිලධාරින්ට ගෙවා තිබුණි. | නිරීක්ෂණ හා එකඟවේ.<br>අතිකාල අරමුදලට අයකරනු ලබන අතිකාල රේටයන් තීරණය කර ඇත්තේ අංක 1520/17 දරණ 2007 ඔක්තෝබර් 07 දිනැති ගැසට් පත්‍රයට අනුවය. වසර ගණනාවක් ගතවුව ද මෙම අයකිරීමේ රේටයන් මෙතෙක් සංශෝධනය වී නොමැත.<br>එසේ වුව ද, පසුකාලීනව පවත්නා ජීවන වියදම් වැඩිවීම හා | විධිවිධාන ප්‍රකාරව මෙම අතිකාල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගනු ලබන්නේ රේගුව විසින් සේවා සපයන බාහිර ආයතන වලින් වේ. එම බාහිර ආයතනවලින් රැස්කරන අරමුදල් ඉක්මවා ගෙවීම් සිදු |

| | |
|---|---|
| නිලධාරීන්ගේ වැටුප් සංශෝධනයන් සැලකිල්ලට ගෙන ගෙවනු ලබන අතිකාල රේටයන් අවස්ථා දෙකක දී සංශෝධනය කර ඇත. එම හේතුව නිසා අතිකාල ගෙවීම් වියදම් වැඩි වී ඇත. | නොකිරීමට කළමනාකරණය විසින් පියවර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අතිකාල ආදායම් ලෙස රු.788,633,867 ක් රැස් කර තිබුණද, එම අරමුදලින් සිදු කර ඇති වියදම රු.848,752,697 ක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අතිකාල අරමුදලේ ඌණතාවය රු.141,774,896 ක් ව තිබුණි. එම ඌණතාවය පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුල අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. මෙම ඌනතාවය ඇතිවීම කෙරෙහි 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම සියයට 50 කින් වැඩිකර තිබීම හේතු වී තිබුණු අතර මෙම අතිකාල ගෙවීම සඳහා පමණක් අභ්‍යන්තර කමිටුවකින් තීරණයක් ලබා තිබුණද මේ සඳහා නිශ්චිත අනුමැතියක් ලැබී නොතිබුණි. එමෙන්ම අරමුදලේ ඌනතාවය පසුගිය වර්ෂයට වඩා රු.86,633,770 කින් වැඩි වී තිබුණි. | අතිකාල අරමුදලට අයකරනු ලබන අතිකාල රේටයන් තීරණය කර ඇත්තේ අංක 1520/17 දරණ 2007 ඔක්තෝබර් 07 දිනැති ගැසට් පත්‍රයට අනුවය. වසර ගණනාවක් ගතවුව ද මෙම අයකිරීමේ රේටයන් මෙතෙක් සංශෝධනය වී නොමැත.<br>එසේ වුව ද, පසුකාලීනව පවත්නා ජීවන වියදම් වැඩිවීම හා නිලධාරීන්ගේ වැටුප් සංශෝධනයන් සැලකිල්ලට ගෙන ගෙවනු ලබන අතිකාල රේටයන් අවස්ථා දෙකක දී සංශෝධනය කර ඇත. එම හේතුව නිසා අතිකාල ගෙවීම් වියදම් වැඩි වී ඇත.<br>කෙසේ වුවද, දැනටත් අතිකාල ගෙවනු ලබන්නේ මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ මු1/රේගු/47/3 දරණ 2004.02.09 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇති පදනම්ගත රේටයට වඩා අඩු රේටයකටය. | අතිකාල අරමුදලේ ලැබීම් ඉක්මවා ගෙවීම් කිරීම පිළිබඳව කළමනාකරණයේ දැඩි අවධානයට යොමුකර අතිකාල ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රේගු අතිකාල, නැව්බඩු පරීක්ෂාකිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශයේ 2019 වර්ෂයේ සමුච්චිත අරමුදලේ ශේෂය හා ජංගම නොවන වගකීම් ශේෂය පිළිවෙලින් රු.2,133,975,332ක් හා රු.13,872,683ක් ලෙස දක්වා තිබුණද එම අගය රු.2,275,913,245 ක් හා රු.13,330,735ක් බව නිරීක්ෂණය විය. | මෙය මුද්‍රණ දෝෂයක් වන අතර අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ 2019 වර්ෂයේ සමුච්චිත අරමුදලේ ශේෂය හා ජංගම නොවන වගකීම් ශේෂය පිළිවෙලින් රු.2,275,913,245 ක් හා රු.13,330,735 ක් වේ. | ගිණුම් නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කල යුතු වේ. |